## කවි කොළය

# බළලා පිටට පැන්නා ජෝතිෂ මල්ලෙන් !

හඳහන බලා හෙට වන දේ නොකිව හැක
යන මේ මතය මම පවසමි නැතිව සැක
කීමට තමිල් වෙල්වම් මිය ඇදෙන එක
බැරිවිය නැකැත් ඇදුරෙකු හට එකම එක

වඩමාරච්චි යුද සමයෙදි මහ යෝද
කොටියා පැරද දෙද්දී කෙඳිරිලි නාද
වළ කජු ගසන පුවතක් මහ කොටි යාද
පැවසී නැකතියෙක්, කෝ ඌ මැරු ණාද?

මරණය උරුම කොට අසරණ මිනි සුන්ට
පළමුව සුනාමිය ගොඩ බිම ගිල ගන්ට
ඒ පිළිබඳව සුළු ඉඟියක්වත් දෙන්ට
ඇයි බැරිවුණේ මේ බක පන්ඩිත යන්ට

දහයක් ගහන විට ගල යයි ඉලක් කෙට
වරදින නමය නොපෙනෙයි හුඟ දෙනෙක් හට
දුන්නත් ඇඟිල්ලෙන් ඇන මෙය මතක් කොට
එය වෙයි හකුරු පැටවීමක් ගොනෙක් පිට

මඟුලට අකුරු කියවීමට දරුවා ගේ
ගෙයි මුල්ගලට, කරඇඹුමට හරකා ගේ
දක්කන්නට පවා අයවැය බරබා ගේ
අවැසිය නැකත මුළු රටටම එකවා ගේ

උගතුන් වුවද සමහරු දැන දැන බොරුව
වැජඹෙති නැකැත්පති වී අතමිට සරුව
කවරක් කරත් දැයි අහසේ ඇති තරුව
බුදුහිමි වදාළෝ නිදහස් මත දැරුව

නුගත් උගත් දෙපිරිස දිවයිනේ හෙළ
වළඳනු පෙනේ ජෝතිෂ නියඟලා අල
ජනතා බුද්ධියට දැනුමට නිගා කළ
පත්තර වලත් පළවෙයි මේ පලා පල

පත්තර දෙකක් ගෙන බැලුවොත් එකට තියා
වැටහෙයි ඒක පව වට්ටෝරුවකි කියා
දුටුවත් පරස්පර අදහස් තිබෙන ලියා
නොබලති මෝඩ තකතිරුවෝ කරුණු සොයා

ශනි කුජ විවාහෙට හත අට මළ ගේකී
යනුවෙන් තවත් මතයකි දනවන ශෝකී
ජෝතිස ගුරුන්ගේ වැඩ හින්දා මේ-කී
අසරණ තරුණියෝ වෙති ගෙදරට නාකී

අසුවල් දිනට අසුවල්
දේ එක එල්ලේ
සිදුවන බව කියා
ගෙනගිය මං කොල්ලේ
ඉර හඳ තාරකා
නැටවූ සිය අල්ලේ
නිරුවත හෙළිවුණා
ජෝතිෂ පව මල්ලේ



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**



**Fidel Castro with Earnesto Che Guevara** in the Sierra Mastra Mountains, Cuba during the 1950s.

In 1953, Castro launched a failed coup against Batista government. He and his brother Raul were imprisoned, but were amnestied and fled to Mexico. It was here Fidel met Che Guevara with whom he plotted **Movimiento 26 de Julio**, the successful overthrow of the Cuban government in 1959.

## නක්ඛත්ත ජාතකය


**නක්ඛත්තං පතිමා-**
**නෙනතං -**
**අත්ථො බාලං උපච්චගා**
**අත්ථො අත්ථස්ස**
**නක්ඛත්තං -**
**කිං කරිස්සන්ති තාරකා**

**නක්‍ෂත්‍රය බලා කටයුතු කරන අඥානයාගේ (මෝඩයාගේ ) වස්තුව ද නිකරුණේ වියදම් වී යයි. යහපතක් බලාපොරොත්තුව ඒ සඳහා නොපසුබට ව කටයුතු කිරීම ම නක්‍ෂාත්‍රය වෙයි. ඈත අහසේ තාරකා කෙසේ නම් පිහිට වේද්ද ?**

ඉහත දැක්වෙන්නේ ජාතක පොතේ **49** වෙනි ජාතකය වන **නක්ඛත්ත** හෙවත් නක්‍ෂාත්‍ර ජාතකයේ ආරම්භක ගාථාවයි. එහි දැක්වෙන අර්ථය බුදුන්වහන්සේ නක්‍ෂත්‍රය ගැන තමන් දරණ මතය පැහැදිලි කරන්නකි.

තාරකාවන් විශ්වාස- කිරීම අනුවණ කමක් බව උන්වහන්සේ දේශනා කර ඇත. එම ගාථාව දෙසන්නට හේතුවූ කතා- වයි නක්ඛත්ත ජාතකය. එම කතාව සොයාගෙන කියවන්න.

♦ **තලන්ගම**



## ඇමරිකාව ළඟ දණනොගැසූ නායකයා





### පිදෙල් කස්ත්‍රෝ 1954 දී සහ 2006 දී

**ව**සර 49 ක් පුරා කියුබාවේ පාලකයා ලෙස කටයුතු කළ ජනාධිපති පිදෙල් කස්ත්‍රෝ අයහපත් සෞඛ්‍ය හේතූන් මත දෙවැනි තැනට සිටි සිය සොහොයුරු රවුල් කස්ත්‍රෝට රටේ පාලනය පවරා ගිය මස ඉවත්විය.

බඩවැල් වල ආබාධ හටගත් බැවින් ගිය වසරේ ඔහු ශල්‍ය කර්මයකට භාජනය විය. පාලනයෙන් ඉවත්ව යමින් කස්ත්‍රෝ ජනතාවට කියා සිටියේ රෝගී තත්වය නිසා වෙනදා මෙන් කඩිසරව වැඩකරන්නට නොහැකි බව දැන දැනම නායකත්වයේ රැඳී සිටීම නුසුදුසු බව ය.

ඇමරිකාව කස්ත්‍රෝ විනාශ කරන්නට වෙර දැරුමුත් ඒ හැම මාරකයකින් බේරුණු ඔහු සිය පාලන කාල සීමාව තුළ ඇමරිකානු ජනාධිපතිවරුන් 9 දෙනෙකු එනවා සහ යනවා දැකගෙන ඇත.

පිදෙල් අලිජැන්ද්‍රෝ කස්ත්‍රෝ රූස් ලෙස 1926 දී ඔහු ඉඩම් හිමි ධනවත් පවුලක උපත ලද්දේය. ජේසුයිට් කතෝලික පාසැලකින් අධ්‍යාපනය ලත් හෙතෙමේ වැඩිදුර ඉගෙන හවානා විශ්වවිද්‍යාලයෙන් නීතිඥයෙකු වශයෙන් උපාධිය ලැබීය. එහෙත් තම ජීවන රටාවේත්, තම රටේ බහුතර යක් දිළිඳු ජනතාවගේ ජීවන රටාවේත් වෙනස පිළිබඳව කම්පනයට පත් පිදෙල්, එම තරුණ වියේදී ම මාක්ස් ලෙනින්වාදී විප්ලවකාරයෙකු වූයේය.

1953 දී කස්ත්‍රෝ ඇතුළු තරුණ පිරිසක් ආයුධ සන්නද්ධව එවක කියුබා ජනාධිපතිව සිටි බැටිස්ටාගේ රජයේ හමුදා කඳවුරකට පහරදුන්නේ අභ්‍යන්තර කැරැල්ලක් අවුළුවන්නටය. එහෙත් එය ව්‍යවර්ථව පිදෙල් සහ සොයුරු රවුල් අසුවීය. සිරබාරයට පත්ව සමාව ලැබ පසුව දෙදෙන මැක්සිකෝවට පැන ගියහ. කස්ත්‍රෝට, චේ ගෙවාරා මුණගැසුණේ එහිදී ය.

කස්ත්‍රෝ සහ පිරිස අවුළුවන ලද සටන්කාමය ඒ අවධියේ බැටිස්ටාගේ දූෂිත පාලනයෙන් හෙම්බත්ව සිටි කියුබානු ජනතාවටද දැනී තිබුණි. 1959 දී කස්ත්‍රෝ, චේ, රවුල් ඇතුළු විප්ලවකාරී පිරිස බැටිස්ටාගේ රජය සාර්ථක ලෙස පෙරළා දමා බලය අතට ගන්නට සමත් වූහ.

එහෙත් ඇමරිකාව මුල සිටම එනම් ජනාධිපති අයිසන්හවර්ගේ සිට මේ දක්වාම පිදෙල් කැස්ත්‍රෝ රිස්සුවේ නැත. හේතුව ඔහු සෝවියට් දේශයේ දැඩි මිතුරෙකු වීමයි. කැස්ත්‍රෝ මරන්නට ඇමරිකාව තැත්කළ වාර සිය ගණනකි. එසේම ඔහුගේ රජය පෙරලා දමන්නට වරක් කළ කුමන්ත්‍රණයද වැරදිණ. එහෙත් ඇමරිකාව එළිපත්තේ සිට එයට තර්ජනය කරන්නට සමත් වූ එකම මිනිසා පිදෙල් කස්ත්‍රෝ පමණ ය. ඔහුගේ බොහෝ වැරදි ඇතත් ඔහු කියුබාවට ඉමහත් සේවයක් කළ ඉතා වටිනා මිනිසෙකි.- **KM**



**ඉරිදා** - දැන් ලංකාවෙ අළුත්ම මෝස්තරය කවුරුහරි මැරි-
**SUN** ච්ච ගමන් මුද්දරයක් නිකුත් කරන එක. ඉස්සර මුද්දරයක් ගැහුවෙ ජාතික වීරයෙක් හරි, රටේ විශේෂ අවස්ථාවක් සිහිකරන්න. දැන් එහෙම නෙවෙයි අඳුරන් නෙත් නැති මිනිස්සු වෙනුවෙන් පවා මුද්දර නිකුත් කරනවලු. කලුතර විල්බට් බාප්ප අමුතු මූණක් තියන මුද්දරයක් දැකලා තැපැල් කන්තෝරුවෙ කවුන්ටරෙන් ඇහුවම කවුද මේ මුද්දරේ ඉන්නෙ කියල, අනේ අපි දන්නෙ නැහැයි කිව්වලු. බාප්ප කියනවා ඔය විදියට ළඟදිම සොත්ති උපාලි, මාළු නිහාල් වගේ මැරිච්ච පාතාලෙ ගණන්කාරයො වෙනුවෙනුත් ලංකාවෙ තැපැල් මුද්දර නිකුත්කරන්න බැරි නැහැයි කියලා.

**සඳුදා** - සුවර්ණලා සීදුවෙ පාර අයිනෙම වගේ ගෙයක්
**MON** හදලා ඒක කුලියට දෙන්න හිතන් ඉන්නෙ. මට අද ටෙලිපෝන් කරපු වෙලාවෙ කිව්වා. හොයන්නෙ ටුවරි- ස්ට්ලා. ලංකාවෙ කෙනෙකුට දුන්නොත් යවාගන්න අමාරු වේවිලු. සිළුමිණ පත්තරේ දැන්වීමක් දාලා, ඒ දැන්වීම මට කියෙව්වා. එයාර් කන්ඩිෂන්, ඇල්වතුර, උණුවතුර, ආදී දේවල්. මං ඇහුවා උණුවතුර එන්න බොයිලර් එකක් හයි කළාද කියලා. හිනාවෙලා කිය- නවා දැන්වීමෙ එහෙම දැම්මට මොන බොයිලර් ද අක්කෙ, මේ රස්නෙට කොහොමත් ඇල්වතුර පයිප්පෙන් එන්නෙත් උණුවතුර නේ කියලා. ලංකාවෙ අන්න එහෙමයි ටුවරිස්ට්ලට 'හොට් වෝටර්' දෙන්නෙ.

**කුජදා** - කිලිනොච්චියට හමුදාවෙන් දාපු බෝම්බවලට
**TUE** තුවාලවෙලා ප්‍රභාකරන්ගෙ කකුලක් කපන්න වෙලයි කියලා දැන් ලොකු කතාවක් යනවා. ඒක අහන් ඉඳලා ඔන්න බොලේ දැන් ලංකාවෙ නක්ෂත්‍රකාරයො එළියට ඇවිල්ලා. එහේ හඳහන් පත්තරේක තිබුණා ග්‍රහයෝගෙ හැටියට ප්‍රභාකරන්ට සෙනසුරාගෙ ඒරාෂ්ටකේය, ඒ අයගේ ජ්‍යොතිෂ්‍ය ඇහැට පේන විදියට මෑන් ළඟදිම වලකජු ගහන්න ඉඩ තියනවයි, වැඩියම අපල තුනටි- යෙන් පහළ කොටසටය, කකුලක නිකම් සැත්කමක් වගේ දෙයක් පේන්න තියනවයි කියලා. හඳහන්කාරයො තවම ලංකාවෙ මිනිස්සු ගොනට අන්දවනවා.

**බුදදා-** ඩයනා කුමරියගේ පුතාවන, රැජිණගෙ මුණුපුරා
**WED** හැරී කුමාරයා ඇප්ඝනිස්ථානෙ යුද්දෙට ගිය එක ගැන පහුගිය දවස්වල බ්‍රිතාන්‍ය පත්තරවල දහසක් ප්‍රශංසා මුඛයෙන් බොහෝ දේ ලියවිලා තිබුණා. රැජිණ වුනත් හරි ආඩම්බරෙන් කතා කළේ, රට වෙනුවෙන් මුණුපුරා ගිය ගමන ගැන. හැරීගෙ ටෙලිවිෂන් ඉන්ටර්- වීව් එක මම දැක්කා. "හතුරො දැන් මාව ඉලක්ක කරාවි, ඒකට කමක් නෑ, මම බය නෑ" කියලා හැරී හිනාවුණා. ඒවා ඇහෙන කොට මට අපේ ලංකාවෙ හමුදාවෙ ඉන්න දාස්ගණනක් තරුණ තරුණියො ගැන ආඩම්බර හිතුණා. මව්බිම වෙනුවෙන් දිවි දෙන්න ඉදිරි යට ආ තරුණ ජීවිත අපේ රටෙත් ඉන්න එක ගැන. තරුණ පුත්‍රයිනි, දියණියනි, නුඹලාට ජයම වේවා!

**ගුරුදා -** ලන්ඩන්වල සහ ඒ අවට පලාත් පාලන ආය-
**THU** තනවල ලංකාවෙ දෙමළ නියෝජිතයො පත්වෙලා ඉන්නවා. ඒ වුනාට ඒ කිසි එකෙක් කවුන්සිල් එකෙන් පඩි ගත්තට කවුන්සිල්එකට වැඩක් කරන්නෙ නෑ. මුළු කාලයම යොදවලා තියෙන්නෙ කොටිසංවිධානෙ වැඩට. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙ මන්ත්‍රීවරු පස්සෙ ගිහින් ශ්‍රී ලංකා රජය ගැන ගතු කියන්න. කොටින්ට දාපු තහනම ඉවත්කරව ගන්න. කීත්වාස්ලා, සයිමන් හියුස්ල වගේ බ්‍රිතාන්‍ය මන්ත්‍රීවරු දැන් කොටින්ගේ අතකොළු බවට පත්වෙලා ඉන්නෙ මේ දෙමළ කවුන්සිල්කාරයන්ගෙ මහන්සිය නිසා. මේ හැම දෙමළ මිනිහෙක්ම ලංකාවෙ ආණ්ඩුවෙන් පඩිගත්තු ඇයො. දැන් වගේම ඒකාලෙත් මේ සේරම සිංහළ මිනිස්සුන්ටයි, ඒ රටටයි විරුද්ධව වැඩකරපු කස්ටිය. සුද්දන්ට අහන්න තියෙන්නෙ මෙච්- චරයි. උපන් රටට ද්‍රෝහි වෙන උඹලව අපි විස්වාස කරන්නෙ කොහොමද කියලා.

**කිව්දා -** මාස ගාණකට පස්සෙ කලුතර කැතරින් නැන්ද
**FRI** ලට ටෙලිපෝන් කළා, සුව දුක් අහන්න. රම්‍යා නංගි පෝන් එක ගත්තෙ. "අයියෝ අක්කෙ, ඔයා මේ කතා කළේ **සුන්දර සිහින** ටෙලිනාට්‍යයේ හොඳම හරිය යන වෙලාවෙ නේ. තව පැයකින් විතර කතාකරන්න බැරිද? මේක මිස්වෙනව නේ. " මම හා කියලා තිබ්බා. කතා කරපු මෝඩකම කියලා මට හිතුණා. ඒ මෝඩකම ආයිත් නම් මම කරන්නෙ නෑ. ඔන්න දැන් ලංකාව.

**ශනිදා** ලංකාවෙ සෞඛ්‍ය ඇමතිගෙ මහත සෞඛ්‍යයට
**SAT** හොඳ නැහැයි කියලා ලංකාවිත්ති පත්තරේ පොටෝ එකත් එක්ක ගිය විස්තරේ දැකලා තලවකැලේ නැන්- දම්මා ලියුමක් එවලා. නැන්ද කියනවා, දුවේ, සෞඛ්‍ය ඇමති විතරක් නෙවෙයි, හැම ඇමතිම, මන්ත්‍රීම පුස් ඌරෝ වගේ. ඇඟ බහින්න ඒගොල්ල දැන් ඇවිදිනවා. ඔය එක එක රටවල්වලට යන්නෙත් ඇඟ බහින්න ඇවිදින්න කියපු හන්දයි. නැතුව මේ සවාරිගහන්න තියන ආසාව හන්ද නෙවෙයි. වැරදියට හිතන්න එපා."